**මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය**

**විදෙස් ගමන් බලපත්‍ර මුද්‍රණය වේගවත් කිරීම සඳහා අවශ්‍ය අමතර කාර්ය මණ්ඩලය සපයා ගැනීම.**

ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ විදෙස් ගමන් බලපත්‍ර මුද්‍රණය පැය 24 පුරාවටම සිදු කිරීම තුළින් වේගවත් කිරීම සඳහා අවශ්‍ය නියෝජ්‍ය පාලක/ සහකාර පාලක තනතුරු සඳහා විශ්‍රාමික නිලධාරීන් කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමට අයදුම්පත් කැඳවනු ලැබේ.

1. මීට පෙර ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය පාලක/ සහකාර පාලක ලෙස සේවය කර පළපුරුද්දක් ඇති ශ්‍රී ලංකා පරිපාලන සේවයේ හෝ ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ නිලධාරීන් විය යුතුය.

2. වයස අවුරුදු 65ට අඩු විශ්‍රාමික නිලධාරීන් සඳහා ප්‍රමුඛතාවය ලබාදෙනු ලැබේ.

3. කොන්ත්‍රාත් පදනම මත සේවය ලබා ගන්නා කාලය මාස 03ක් සඳහා පමණි.

4. ඉල්ලුම් කරනු ලබන නිලධාරීන් මනා සෞඛ්‍ය තත්ත්වයෙන් යුක්ත විය යුතු අතර අදාල තනතුරෙහි සේවය කිරීමට කායික/ මානසික යෝග්‍යතාවයෙන් යුක්ත බවට රජයේ වෛද්‍ය නිලධරයෙකු විසින් ලිඛිතව සහතික කර තිබිය යුතුය.

5. මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති අයදුම්පත්‍රය (ඇමුණුම 01) හා විශ්‍රාමික නිලධරයන්ගේ සෞඛ්‍ය තත්ත්වය පිළිබඳ සෞඛ්‍ය 307 ආකෘතිය සමඟ ජීවදත්ත පත්‍රිකාවක් ද ඉදිරිපත් කිරීම අනිවාර්යය වේ.

6. අයදුම්පත් කැඳවනු ලබන අවසන් දිනය 2025 පෙබරවාරි මස 23 වන දින වේ. එදිනට ප්‍රථම අයදුම්පත්‍රය, සෞඛ්‍ය 307 ආකෘතිය හා ජීවදත්ත පත්‍රිකාව පරිලෝකනය කර (Scan) adimmirecruit@gmail.com යන විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කළ යුතුය.

7. නැවත සේවයේ යොදවනු ලබන විශ්‍රාමික නිලධරයන් සඳහා ගෙවනු ලබන දීමනා 2018.02.20 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2018 හි හා එහි සංශෝධනයන් පරිදි තීරණය කරනු ලැබේ.

මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා විසින් 2025.02.02 දිනැතිව ඉදිරිපත් කළ අංක 07/2025 දරණ අමාත්‍ය මණ්ඩල සංදේශයට ලද අංක 25/0214/821/001-II හා 2025.02.05 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතිය පරිදි

බී.එම්.ඩී.එන්. බාලසූරිය
ආගමන විගමන පාලක ජනරාල් (වැ.බ.)
ආගමන හා විගමන දෙපාර්තමේන්තුව

2025 පෙබරවාරි මස .10.. වැනි දින
ආගමන හා විගමන දෙපාර්තමේන්තුව
සුහුරුපාය
බත්තරමුල්ල